# මෙතෙක් හෙළිදරව් නොවූ කාර්මික පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රයක් පිළිබඳ මූලික අධ්‍යයනයක්

එම්. පියුමි හංසමාලි*

පුරාවිද්‍යාව යනු බහුවිෂයීය සම්බන්ධතාවක් ඇති විෂයකි. එම බහුවිෂයීතාවය හා අන්වයානුගත විෂයක් ලෙස, " නූතන සමාජ, ආර්ථික හා තාක්ෂණික වර්ධනයේ මුල් කාලයට අයත් සථාන, ස්මාරක හා යන්ත්‍ර සූත්‍ර ආදියෙහි ද්‍රව්‍යාත්මක අවශේෂ පිලිබඳ කෙරෙන අධ්‍යයනය" කාර්මික පුරා විද්‍යාවට අයත් වේ. 18, 19 සියවසේ දී කාර්මික විප්ලවය හේතුවෙන් එංගලන්තය ඇතුළු යුරෝපීය රටවල විශේෂිත වෙනස්කම් රාශියක සිදු වූ අතර එය විප්ලවීය වෙනසකි. පූර්වයෙහි වූ සාම්ප්‍රදායික ක්‍රම අතහැර සංකීර්ණ යන්ත්‍ර මූලික සමාජයකට අඩිතාලම වැටුණි. යටත්විජිතවාදය ඔස්සේ මෙම තාක්ෂණය ලංකාවට ද පැමිණියේ ය. මෙලෙස බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ බ්‍රිතාන්‍ය ජාතිකයින් ස්වකීය දේශපාලන හා ආර්ථික අරමුණු මුදුන්පත් කරවා ගැනීමට රජයේ කර්මාන්තශාලාව පිටකොටුවේ දී 1849 දී ප්‍රථමයෙන් පිහිටුවන ලද අතර 1925-1929 කාලයේදී කොලොන්නාවට ගෙන එන ලදී. මා විසින් මෙම පර්යේෂණය හරහා කොලොන්නාව රජයේ කර්මාන්තශාලාව කාර්මික පුරාවිද්‍යාත්මක උරුම ස්ථානයක් වශයෙන් නම් කිරීමට අවශ්‍ය වන එම ක්ෂේත්‍රය තුළ දැනට ශේෂව පවතින ද්‍රව්‍යාත්මක සාධක අධ්‍යයනය කළ අතර එහි දී මෙම කර්මාන්තශාලාව කාර්මික පුරාවිද්‍යාත්මක ස්ථානයක්, ස්මාරකයක් හා බ්‍රිතාන්‍යයෙන් මෙරටට ආනයනය කරන ලද යන්ත්‍ර- සූත්‍ර හා ඒවායේ වැදගත්කම , ඒවා නිෂ්පාදිත ආයතන, වර්ෂ හා එම යන්ත්‍ර- සූත්‍රවලින් නිෂ්පාදන කරන ලද නිෂ්පාදනයන්, ඒවායේ ගුණාත්මකභාවය විශ්ලේෂණය කළ අතර තවදුරටත් මේ ආයතනය එවකට දේශපාලනය, ආර්ථිකය හා සමාජය කෙරෙහි බද්ධ වූ ආකාරය අධ්‍යයනය කරන ලදී. එම තොරතුරු මත පදනම්ව කොලොන්නාව රජයේ කර්මාන්තශාලාව කාර්මික පුරාවිද්‍යාත්මක උරුම ස්ථානයක් වශයෙන් නම් කිරීමට අවශ්‍ය වන සාධකයන්ගෙන් පෝෂිත බව තහවුරු විය.

ප්‍රමුඛ පදඃ- කර්මාන්තශාලාව, යන්ත්‍ර- සූත්‍ර, කාර්මික, බ්‍රිතාන්‍ය

* පුරාවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය piumistpiumiperera@gmail.com